# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,479 — 1965 අගෝස්තු 12 වැනි බ්‍රහස්පතින්ද — 1965.8.12**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 295**

අ.ආ.කා. අංකය : සී. 118/47 (2)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික හා සභාපති, හැක්ටර් සෙනරත් රාජකරුණා බන්ඩා කොබ්බෑකඩුව මහතාගේ සේවා කාලය අවසන් වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 58 වැනි වගන්තිය යටතේ, 1965 අගෝස්තු 12 වැනි දින සිට, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන්, මේජර් එඩ්වර්ඩ් ඇලෙක්සැන්ඩර් නුගවෙල මහතා පත් කළ බව, මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් එකී මේජර් එඩ්වර්ඩ් ඇලෙක්සැන්ඩර් නුගවෙල මහතා, 1965 අගෝස්තු 12 වැනි දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කළ බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි.

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 අගෝස්තු 9 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

8-496


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1207——ආර් 8049—6,225 (65/8)